කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

ඉතිහාසය I.

11 ශ්‍රේණිය

කාලය පැය 01 යි

සැලකිය යුතුයි,

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ලංකාවේ පැරණිතම සාහිත්‍ය මූලාශ්‍රයක් වන මහාවංශයට අභාසය ලැබී ඇත්තේ මින් කුමකින් ද?

i. දීපවංශය
ii. ජාතකට්ඨ කතා
iii. වංසත්ථප්පකාසිනි
iv. උත්තර විහාරට්ඨ කතා

02. 'ලංකා පුරාවෘත්තය' නම් සාහිත්‍ය මූලාශ්‍රයේ රචකයා වන්නේ,

i. ඉබන් බතූතා
ii. රිබෙයිරෝ
iii. රොබට් නොක්ස්
iv. පිලිප්පස් බැල්ඩියස්

03. ප්ලයිස්ටොසීන භූ අවධියට අයත් ඉරණමඩු සැකැස්ම දක්නට ඇත්තේ,

i. ශුෂ්ක කලාපයේ
ii. අර්ධ ශුෂ්ක කලාපයේ
iii. පහත රට වියළි කලාපයේ
iv. තෙත් කලාපයේ

04. වසර 80000 ට පෙර භාවිතා කළ ගල් මෙවලම් පොළොව මතුපිට සිට අඩි 24ක් යටින් හමුවිය. එම ප්‍රදේශය කුමක්ද?

i. පතිරාජවෙල
ii. මිනිහාගල් කන්ද
iii. වැල්ලේ ගංගොඩ
iv. රංචාමඩම

05. ක්‍රි.පූ. 1129 තරම් ඈත කාලයේදී ද මැටි වළං තැනීමේ හා පින්තාරු කිරීමේ තාක්ෂණය මෙරට පැවති බවට සාක්ෂි හමුවූයේ,

i. උඩරංචා මඩමෙන් ය.
ii. හල්දුම්මුල්ලෙන් ය.
iii. බෙරගලින් ය.
iv. පතිරාජ වෙලින් ය.

06. අතීතයේ දී ගම් කිහිපයක පරිපාලනය සඳහා දසගම් ඇත්තන් නම් මණ්ඩලයක් ගැන සටහන්ව ඇති සෙල්ලිපිය කුමක්ද?

i. කොරවක්ගල ගුහා ලිපිය
ii. කළුඳිය පොකුණ ලිපිය
iii. ඇඹුල් අඹේ ලිපිය
iv. ගනේකන්ද විහාර ලිපිය

07. ක්‍රි.පූ. 250 දී ගල්ගුහාවක් භික්ෂූන්ට පූජා කළ පරුමකවරයෙක් ගැන කොග්ගල්කන්ද සෙල් ලිපියේ සඳහන් වේ. එම පරුමකගේ නම?

i. ශොට ශොජක ය
ii. පරුමක සුමන ය
iii. ගමික සිව ය
iv. ගමික තිදන ය

08. 'වල්ලංගාව' යනු

i. සන්නසකි
ii. අමුණකි
iii. වැව්පද්ධතියකි
iv. යාපනයට කී නමකි

09. තමා 'නරේශ්වර' ලෙස හඳුන්වා ගත් රජු කවුද?

i. ආමණ්ඩගාමිණී අභය රජු
ii. මහසෙන් රජු
iii. කූටකණ්ණ අභය රජු
iv. නිශ්ශංකමල්ල රජු

10. 'එක්තැන් සමිය' යනුවෙන් අතීතයේදී හඳුන්වා ඇත්තේ කුමක්ද?

i. අධිකරණය යි
ii. රාජ සභාවයි
iii. අමාත්‍ය මණ්ඩලයයි
iv. රාජ ආඥාවයි

11. 'උපසග්ගරෝගනාස' යනුවෙන් හඳින්වෙන රෝහල ඉදි කළ රජු කවුද?

i. බුද්ධදාස රජ
ii. V වන මහින්ද රජ
iii. භාතිකාභය රජ
iv. IV වන කාශ්‍යප රජ

12. ක්‍රි.ව. 950 පමණ කාලයේදී ද මෙරට වෙළඳපොළවල් සංවිධානාත්මකව පාලනය වූ බවට සාක්ෂි සපයන මූලාශ්‍රය,

i. හෝපිටිගම සෙල් ලිපියයි
ii. අලුවල සෙල්ලිපියයි
iii. මණ්ඩගල සෙල්ලිපියයි
iv. සොරබොරවැව ටැම් ලිපියයි

13. වරිච්චියෙන් සාදා පන් ඉලුක් සෙවිලි කළ භික්ෂු නිවාස හැඳින්වූ යේ කුමන නමකින්ද?

i. පණ්ණ ශාලා
ii. සොත්ථි ශාලා
iii. වෙජ්ජශාලා
iv. පසවන්තිනාම ශාලා

14. ස්වභාවධර්මයේ පවතින මූලධර්ම තේරුම් ගෙන ඒවා ආදේශ කිරීමට විද්‍යාත්මක දැනුමක් පැරණි ලාංකිකයන්ට විය. මේ සඳහා ගත් පැරණිතම උත්සාහය ලෙස හඳුනා ගත හැක්කේ,

i. මැටි ඔරු සුසාන ඉදිකිරීම
ii. වරිච්චි නිවාස ඉදිකිරීම
iii. මැටි වළං සාදාගැනීම
iv. බිම්විදුරු වලින් සමමිතික ගල් මෙවලම් තැනීම

The National e-learning Portal for The General Education

15. පහත සඳහන් මූලාශ්‍ර හා ඒවා අයත් යුග නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| මූලාශ්‍රය | යුගය |
|---|---|
| 1. වෙව්ලිපුරම් රන්පත | A. පොළොන්නරු යුගය |
| 2. ගල්පොත ශිලා ලිපිය | B. ගම්පොළ යුගය |
| 3. සද්ධර්මාලංකාරය | C. අනුරාධපුර යුගය |
| 4. පූජාවලිය | D. දඹදෙණි යුගය |

i. ABDC
ii. CABD
iii. DCAB
iv. BCDA

16. අවම පීඩනයක් යටතේ ජලය පිටතට මුදා හැරීමට අතීතයේ දී වැවට එක් කළ අංගය,

i. සොරොව්ව
ii. රළපනාව
iii. බිසෝකොටුව
iv. මොහොල

17. ස්ථිතික ජලවිද්‍යා මූලධර්මය යොදාගෙන කළ නිර්මාණයකි.

i. දියකැට පහණ
ii. බිසෝකොටුව
iii. ඇත් පහන
iv. කුට්ටම් පොකුණ

18. ගජබාහු රජු මහා විනිශ්චය ශාලාවෙන් ලැබෙන දඩ මුදල් භික්ෂූ සිව්පසය සඳහා යෙදවීම.

මිනී මැරීමට දඬුවම එල්ලා මැරීමයි.

ඉහත සඳහන් අධිකරණ කටයුතු ගැන සඳහන් සෙල්ලිපි පිළිවෙලින් දක්වන්න.

i. වේවැල්කැටිය හා ගොඩවාය යි.
ii. සිතුල්පව්ව හා වෙස්සගිරිය යි.
iii. සොරබොර හා වෙස්සගිරිය යි.
iv. සිතුල්පව්ව හා වේවැල් කැටිය යි.

19. ඉතා පුරාණයේ දී මෙරට වැසියන් වල් දෙල් හා ඇට කෙසෙල් ආහාරයට ගත් බවට සාක්ෂි හමුවූයේ,

i. කිතුල්ගල බෙලි ලෙනින් ය
ii. පාහියන් ලෙනින් ය
iii. අලිගලින් ය
iv. හෝටන්තැන්නෙන් ය

20. අග්නිදිග ආසියාතික වාස්තු විද්‍යාවේ ලක්ෂණ මෙරට වාස්තු විද්‍යාවට බලපා තිබූ බවට හොඳම නිදසුන මින් කුමක්ද?

i. නිශ්ශංක ලතා මණ්ඩපයයි.
ii. සත් මහල් ප්‍රාසාදයයි.
iii. අවුකන බුද්ධ ප්‍රතිමාවයි
iv. ලෝවා මහාපායයි

21. මලය අර්ධද්වීපයේ සිට පැමිණි චන්ද්‍රභානු රජු මෙරට ආක්‍රමණය කළේ

i. ක්‍රි. ව. 1267 දී ය.
ii. ක්‍රි. ව. 1255 දී ය.
iii. ක්‍රි. ව. 1247 දී ය.
iv. ක්‍රි. ව. 1272 දී ය.

22. කෝට්ටේ රාජධානි සමයේ මෙරටට පැමිණි විදේශීය ජාතිකයෙකුට දැකිය හැකි සිද්ධියක් වන්නේ

i. හයවන බුවනෙකබාහු රජුගේ අභිෂේක මංගලයයි.
ii. හතවන පරාක්‍රමබාහු රජුගේ අභිෂේක මංගලයයි.
iii. බෝසත් විජයබාහු රජුගේ අභිෂේක මංගලයයි.
iv. සිව්වන බුවනෙකබාහු රජුගේ අභිෂේක මංගලයයි.

23. මෙහි පළමුවැන්න දෙවැන්න බිහිවීම කෙරෙහි කර ඇති බලපෑම අනුව ඒවායෙහි අනුපිළිවෙල දැක්වෙන පිළිතුර වන්නේ,

| | |
|---|---|
| 1. කීර්ති ශ්‍රී රාජසිංහ රජු | A. නව රාජවංශයක ආරම්භය |
| 2. රාජාධි රාජසිංහ රජු | B. මුහුදුබඩ ලන්දේසි පාලනය |
| 3. I වන විමල ධර්මසූරිය රජු | C. සියම් නිකාය |
| 4. දෙවන රාජසිංහ රජු | D. මුහුදුබඩ ඉංග්‍රීසි පාලනය |

i. BADC
ii. CDAB
iii. DCAC
iv. BACD

24. යුරෝපයේ ඇති වූ පුනරුදය හා සම්බන්ධ නැති ප්‍රකාශය කුමක් ද?

i. මානවවාදය හෙවත් මිනිසා උතුම් කොට සැලකීම
ii. සියලු බලතල රජු වටා කේන්ද්‍රගත වීම
iii. චෙක්පත් හා බැංකු අණකර ක්‍රමය බිහිවීම
iv. අචල ජල විද්‍යා මූලධර්මය භාවිතයට පැමිණීම

25. පෘතුගීසීන් කොළඹ කොටුවේ සිරගතකර සිටි විදියේ බණ්ඩාරව රහස් උමගක් කප්පවා නිදහස් කර ගත්තේ,

i. සුනේත්‍රා දේවියයි
ii. සමුද්‍ර දේවියයි
iii. නිකපිටියේ බණ්ඩාරයි
iv. වීරසුන්දර බණ්ඩාරයි

26. කාර්මික විප්ලවය පළමුව බ්‍රිතාන්‍යයේ ආරම්භ වීමට වඩාත් බලපෑ හේතුවක් වූයේ,

i. ජාතික රාජ්‍ය බිහිවීම යි.
ii. ඉංග්‍රීසි විප්ලවය යි.
iii. වාණිජ නීති නොවීමයි.
iv. නිදහස් සමාජ පසුබිමයි.

27. යකඩ හා වානේ කර්මාන්තයේ දියුණුවට බලපෑ විවෘත උදුන් ක්‍රමය සොයා ගත් වර්ෂය,

i. 1865
ii. 1870
iii. 1860
iv. 1856

28. ගල් අඟුරු කර්මාන්තය සඳහා ආරක්ෂක ලාම්පුව නිපදවූයේ කවුද?

i. හම්ප්‍රි ඩේවිඩ්
ii. තෝමස් නිව්කොමන්
iii. ජෝන් කේ
iv. විලියම් සීමන්ස්

29. ජෙත් රොටල් කො විසින් අඩු බීජ ප්‍රමාණයකින් වැඩි ඵලදායීතාවක් ලබා ගැනීමට හඳුන්වා දුන් ක්‍රමය කුමක් ද?

i. ශෂ්‍ය මාරුව
ii. පේළියට වැපිරීමේ ක්‍රමය
iii. මහාපරිමාණ ගොවිබිම් ආරම්භය
iv. රසායන පොහොර භාවිතය

30. මහාමාර්ග තැනීමේ ක්‍රමය ලංකාවට හඳුන්වා දෙන ලද්දේ කුමන වසරේදී ද?

i. 1865
ii. 1804
iii. 1885
iv. 1860

31. රාජ්‍ය නිර්බාධවාදය නම් ආර්ථික සංකල්පය ඉදිරිපත් කළේ,

i. වී. අයි. ලෙනින් ය.
ii. කාල්මාක්ස් ය.
iii. ඇඩම් ස්මිත් ය.
iv. රොබට් බැක්වෙල් ය

32. ලංකාවේ දුම්රිය මාර්ගය තැනීමට අවශ්‍ය පියවර ගත් ආණ්ඩුකාරවරයා කවුද?

i. හෙන්රි වෝඩ්
ii. එඩ්වඩ් බාන්ස්
iii. හර්කියුලිස් රොබින්සන්
iv. වෙසට් රිජ්වේ

33. කන්ද උඩරට රාජධානියට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි දූතයා වන්නේ,

i. හියු බොයිඩ්
ii. ජෝන් ෆයිබස්
iii. රොබට් ඇන්ඩෲස්
iv. මැක්ඩෝවල්

34. මෙරට කච්චේරි ක්‍රමයේ ආරම්භය සිදුවූයේ

i. මදුරාසි පාලනටතේ ය.
ii. ද්විත්ව පාලනය යටතේ ය.
iii. කිරීටයේ පාලනය යටතේ ය.
iv. ලන්දේසි පාලනය යටතේ ය.

35. 1803 උඩරට ආක්‍රමණයට හේතුවක් වන්නේ
i. හජ්ජි මරික්කාර් ඝාතනයයි
ii. උඩරට රජු ප්‍රංශයෙන් ආධාර ගැනීමයි
iii. කඩවත් වලින් බදු අය කිරීමය.
iv. කන්ද උඩරටට ඉංග්‍රීසි ධූතයන්ට ඇතුළු වීමට නොදීමයි.

36. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට එරෙහිව සබරගමුවේ කැරැල්ලක් ඇති කළේ කවුද?

i. පිළිමතලාවේ
ii. ඇහැලේපොළ
iii. මොල්ලිගොඩ
iv. එක්නැළිගොඩ

37. 1815 දී උඩරට ගිවිසුමට අත්සන් කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා

i. තෝමස් මෙට්ලන්ඩ්
ii. හියු ක්ලිෆර්ඩ්
iii. රොබට් බ්‍රවුන්රිග්
iv. හෙන්රි මැකලම්

38. කැප්පෙට්ටිපොළ හා මඩුගල්ලේ දෙදෙනාගේ හිස ගසා මරණයට පත් කරන ලද්දේ

i. 1815 මාර්තු 02
ii. 1818 නොවැම්බර් 26
iii. 1818 අගෝස්තු 26
iv. 1818 සැප්තැම්බර් 26

39. 1848 දෙවන නිදහස් සටනේ දී රජු ලෙස අභිෂේක ලැබුවේ

i. ඩිංගි රාළ
ii. පුරන් අප්පු
iii. ගොංගාලේගොඩ බණ්ඩා
iv. කුඩාපොළේ තෙරුන්

40. 1848 නිදහස් සටනට හේතු වූ නව අධිකරණ ප්‍රතිසංස්කරණය සිදු කළේ

i. ටොරින්ටන් ආණ්ඩුකරුය
ii. විලියම් කෝල්බෲක් ආණ්ඩුකරුය
iii. චාල්ස් හේ කැමරන්ය
iv. එඩ්වඩ් බාන්ස්ය

e තක්සලාව The National e-learning Portal for The General Education

කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

## ඉතිහාසය - II

11 ශ්‍රේණිය

කාලය පැය 03 යි

සැලකිය යුතුයි,

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න පහක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

01) ආ) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

පේදුරු තුඩුව / දඹුල්ල / මන්නාරම / කෝට්ටේ / කලා වැව / යාන් ඔය / අලුගල්ගේ / පොතාන / පාහියන් ලෙන/ දීඝගාම

(ලකුණු 10)

ආ) ඕලන්දය / මදුරාසිය / ස්පාඤ්ඤය / තුර්කිය / පර්සියන් බොක්ක / වැනීසිය / ග්‍රීසිය / තාමුලිප්ත වරාය.

(ලකුණු 8)

ඇ) පහත A B C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු ආශ්‍රිත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

A. බෞද්ධ රාජධානි පිළිබඳ තොරතුරු ඇතුළත් වින මූලාශ්‍රය කුමක්ද?
B. ඉරණමඩු සැකැස්ම නිර්මාණය වූයේ කුමන හූ අවධියේදී ද ?
C. මැටි භාණ්ඩ නිපදවීමේ තාක්‍ෂණයේ උසස් ප්‍රමිතිය පෙන්වන වර්ණ කළ මැටි බඳුන හමුවූයේ කුමන ප්‍රදේශයෙන් ද ?
D. බුවනෙකබාහු රජුගේ බෑණා වන වීදිය බණ්ඩාරගේ බිසවගේ නම කුමක්ද ?

(ලකුණු 4)

ඉ) පහත A සහ B යටතේ දක්වා ඇති පින්තූර ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



i. මෙම පින්තූරයේ දැක්වෙන යන්ත්‍රය නම් කරන්න.
ii. මෙම යන්ත්‍රය නිසා දියුණු වූ කර්මාන්ත ක්ෂේත්‍රය කුමක්ද ?
iii. මෙම යන්ත්‍රය නිපදවූයේ කවිද ?
iv. මෙම යන්ත්‍රය උපයෝගී කරගෙන සිදුකළ කාර්යය කුමක්ද ?

B



i. මෙම රූපයේ සිටින පුද්ගලයාගේ නම කුමක්ද ?
ii. ඔහු ජීවත් වූයේ කුමන රටේද ?
iii. මොහු විසින් ලියන ලද වැදගත් ලියවිල්ල කුමක්ද?
iv. ක්‍රි.ව. 1794 දී මොහුගේ රට ආක්‍රමණය කළ ජාතිය කුමක්ද ?

(ලකුණු 08)

02)

i. ශ්‍රී ලංකාවට පැමිණ මෙහි ඇති තතු දැකබලා ඒ ගැන තොරතුරු වාර්තා කළ විදේශ කතුවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

ii. පූර්ව ඓතිහාසික යුගයට අයත් දැනට කාල නිර්ණය කර ඇති සුසාන 3 ක් හා නේවාසික ස්ථානයක් නම් කරන්න. (ලකුණු 04)

iii. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාව සැකසී තිබූ ආකාරය මූලික සාධක 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. මුල් ඓතිහාසික යුගයට අයත් ජනාවාසවල ස්වභාවය හා පරිපාලන රටාව උදාහරණ සමඟ වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 06)

03)

i. මහා වංශයට අනුව මෙරට ප්‍රථම රජු වූ පණ්ඩුකාභය කුමරු රාජත්වය තහවුරු කරගත් ප්‍රධාන අවස්ථා 3 සඳහන් කරන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් රාජ්‍යතන්ත්‍රික නිලයන් හඳුන්වන්න.

a. මපුරුමුකා -

b. මහමත -

c. නගර ගුතික -

d. හති අදෙක -

(ලකුණු 04)

iii. දුටුගැමුණු රජු රාජ්‍ය බලය වර්ධනය කරගැනීමටත් බුදු දහම නගා සිටුවීමටත් එක සේ ක්‍රියා කිරීම කැපී පෙනෙන ලක්ෂණයකි. උදාහරණ දෙමින් මෙය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. අතීතයේ රට පාලනය කළ බුද්ධිමත් රජවරු විදේශ රාජ්‍යයන් සමග සුහදශීලී සබඳතා ඇති කර ගත්හ. උදාහරණ 3 ක් ගෙන මෙය විස්තර කරන්න.

(ලකුණු 06)

04)

i. පුරාණ ශ්‍රී ලංකාවේ පැවති සුළු කර්මාන්ත 3 ක් ලියන්න. (ලකුණු 03)

ii. ශ්‍රී ලංකාවේ පැරණි යකඩ නිස්සාරණය කිරීමේ තාක්ෂණය හඳුනා ගත හැකි යකඩ උඳුන් හමු වූ ස්ථාන දෙක කුමක්ද ? (ලකුණු 04)

iii. අතීත විද්‍යාත්මක හා තාක්ෂණික දැනුමේ ස්වභාවය පැරැන්නන්ගේ ජල කළමනාකරණයෙන් හඳුනාගත හැකිය. උදාහරණ 2 ක් මගින් මෙය පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. ස්වභාව ධර්මයට අයත් භෞතික තත්ත්ව මැන ගැනීමට සුදුසු ක්‍රමවේද පැරණි සමාජය තුළ තිබූ බව සාධක 3 ක් ඇසුරින් තහවුරු කරන්න. (ලකුණු 6)

05)

i. පහත සඳහන් නීති පැනවූ රජවරු කවුද ?

a) කිසිදු සතකු නොමැරිය යුතුය.

b) එළුවන්, මී හරකුන් සහ එළ හරකුන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම පැමිණවීම

c) ජලාශවල ජීවත්වන පක්ෂීන් නොමැරිය යුතුය.

(ලකුණු 03)

ii. පුරාණ කාලයේ සිටම මෙරට විදේශිකයන් සමග වෙළඳ කටයුතුවල නිරත වූ බවට සාක්ෂි කාසි මගින් හමුවේ. එසේ හමුවූ විදේශ කාසි වර්ග 4 ක් නම් කරන්න. (ලකුණු 04)

iii. පරිසරය සංරක්ෂණය කර ගැනීමට සංවිධානාත්මක වැඩපිළිවෙලක් අතීත පාලකයන් සතුව තිබූ බව උදාහරණ 02 කින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. සමාජයක තිරසාර පැවැත්මට නීතිය ආචාරධර්ම හා සම්ප්‍රදායන් නිසි අයුරින් ක්‍රියාත්මක වීම අවශ්‍ය වේ. ඊට පුද්ගල හා සමාජ කණ්ඩායම්වල සම්බන්ධතාවන් හි ස්වරූපය වැදගත් වන ආකාරය ඓතිහාසික ලාංකීය සමාජ සංවිධානය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

06)

i. මහනුවර යුගයේ දිසාව තුළ සිටි ශිල්පීන් හෝ කුලයන් ඔවුන්ගේ කාර්ය අනුව වෙනම සංවිධානය කර තිබුණි. එම සංවිධාන ව්‍යුහයට උදාහරණ 3 ක් ලියන්න.

(ලකුණු 03)

ii. මහනුවර රාජධානි සමයේ මහ රජු විසින්ම විසඳනලද නඩු වර්ග 4 ක් නම් කරන්න.

(ලකුණු 04)

iii. පළමුවන විමලධර්මසූරිය රජුගේ සේවාව දේශපාලන හා ආගමික ක්ෂේත්‍ර ඔස්සේ උදාහරණ සහිතව අගයන්න.

(ලකුණු 05)

iv. මහනුවර රාජධානි සමයේ ආර්ථික රටාව හා සමාජ සංවිධානය ගොඩනැගී තිබූ ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

07)

i. කාර්මික විප්ලවය සිදු වූ ක්ෂේත්‍ර කුමක්ද ?

(ලකුණු 03)

ii. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයේ ආරම්භ වීමට බලපෑ හේතු 4 ක් ලියන්න.

(ලකුණු 04)

iii. කාර්මික විප්ලවය නිසා ආර්ථික හා සමාජ ක්ෂේත්‍රයන්හි සිදුවූ වෙනස්කම් දෙක බැගින් පැහැදිලි කරන්න.

(ලකුණු 5)

iv. බ්‍රිතාන්‍යයේ ඇති වූ කාර්මික විප්ලවයේ බලපෑම ශ්‍රී ලාංකික සමාජයට දැනුනු අයුරු පහත මාතෘකා ඇසුරින් පැහැදිලි කරන්න.

a. ප්‍රවාහන අංශය

b. වතුවගාව හා මහාපරිමාණ කර්මාන්ත ශාලා

c. පන්ති සමාජයක් බිහිවීම

(ලකුණු 6)

08)

i. ඉංග්‍රීසීන්ට ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමල වරාය වැදගත් වූ සාධක 3 ක් ලියන්න.

(ලකුණු 3)

ii. මියුරන් කොමිසමේ නිර්දේශ 4 ක් ලියන්න.

(ලකුණු 4)

iii. උඩරට රාජධානිය ඉංග්‍රීසීන් අතට පත්වීමට බලපෑ හේතු 02 ක් ලියා එකක් විස්තර කරන්න. (ලකුණු5)

iv. ක්‍රි.ව. 1818 පළමු නිදහස් අරගලයට හා ක්‍රි.ව. 1848 දෙවන නිදහස් අරගලයට බලපෑ හේතු 02 බැගින් ලියා ක්‍රි.ව. 1848 සටනෙහි ප්‍රතිඵල විස්තර කරන්න.

(ලකුණු 06)